සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2022 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2022-08-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

  (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

  (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

  (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

***අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.***

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත [Employees' Trust Fund (ETF)] යටතේ ආවරණයෙන් බැහැර කරන ලද සේවා කාණ්ඩය වන්නේ කුමක් ද?

(1) විශ්ව විද්‍යාල සේවකයින්.
(2) ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්.
(3) ගෘහස්ථ සේවකයින්.
(4) පෞද්ගලික අංශයේ සේවකයින්.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, දිසා අධිකරණය සතු බලතලයක් **නොවන්නේ** කුමක් ද?

(1) දික්කසාද නඩු.
(2) සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල්වල (ETF) හිඟ මුදල් අයකර ගැනීම.
(3) ඉඩම් නඩු.
(4) ගිවිසුම් කඩකිරීම සම්බන්ධ නඩු.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, මුස්ලිම් නීතිය සුවිශේෂීව යෙදෙන අවස්ථාවක් **නොවන්නේ** කුමක් ද?

(1) භාරකාරීත්වය. (2) උරුමය හා අනුප්‍රාප්තිය.

(3) විවාහය සහ වෛවාහක අයිතිවාසිකම්. (4) ඔට්ටි (Utti) උගස.

1.4 ප්‍රතිජ්ඨාව තීරණය කිරීමට අනුගමනය කරන ක්‍රමයන් පහත පරිදි හඳුනාගත හැකිය:

**(a)** මිල තීරණය කරන ආකාරය ගිවිසුමේ සඳහන් කළ හැකිය.

**(b)** පාර්ශවකරුවන් අතර කටයුතුවලදී මිල නියම කළ හැකිය.

**(c)** මිල තීරණය කර නොමැති විට, ගැණුම්කරු විසින් සාධාරණ මිලක් ගෙවිය යුතුය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව නිවැරදි ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළඳාමේ ඇති මිල, රක්ෂණය, ගැල් කුළී (CIF) ගිවිසුමකට අනුව විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත යැවිය යුතු ලියවිල්ලක් **නොවන්නේ** කුමක් ද?

(1) රක්ෂණ සහතිකය. (2) ඉන්වොයිසිය.

(3) ණයවර ලිපිය. (4) නෞභාර පත්‍රය.

1.6 1950 අංක 53 දරණ කාර්මික ආරවුල් පනත අනුව, කිසියම් කාර්මික ආරවුලක් විසඳිය හැකි විකල්ප ක්‍රමවේදයක් **නොවන්නේ** පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) සාමූහික ගිවිසුමක් මගින්. (2) බේරුම් කිරීම මගින්.

(3) දිසා අධිකරණයක් මගින්. (4) කම්කරු විනිශ්චය සභාවක් මගින්.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක **1.7** සිට **1.9** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව, විකුණුම් ගිවිසුමක් ලිඛිතව පමණක් සිදුවිය යුතුය.

1.8 නෞභාර පත්‍රය, නැව්ගත කළ භාණ්ඩ සඳහා කුවිතාන්සියක් (receipt) ලෙස කටයුතු කරනු ලබයි.

1.9 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අදාල වනුයේ එක් සේවායෝජකයෙකු යටතේ වසර තුනකට නොඅඩු කාලයක් සේවය සම්පූර්ණ කොට ඇති සේවකයන් සඳහා වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.10 නියෝජ්‍යත්වය ඇතිවිය හැකි ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

1.11 මිල, රක්ෂණය, ගැල් කුළී (CIF) ගිවිසුමක් යටතේ විකුණුම්කරුවෙකුගේ වගකීම් දෙකක්(02) සඳහන් කරන්න.

1.12 සේවකයා සහ ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස හඳුනාගැනීම සඳහා අධිකරණය විසින් ගොඩනගන ලද පරීක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.13 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත මගින් හඳුනාගන්නා ලද නිවාඩු වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

1.14 කොටස් වෙළෙඳපොලේ අභ්‍යන්තර ගනුදෙනු / වෙළඳාම (insider dealing) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**ලැරී** විසින් ගරාජ් හිමිකරුවෙකු වු **ජේම්ස්**ගෙන්, ලොරි රථයක් මිලදී ගන්නා ලදී. **ලැරී** එම ලොරි රථය ඔහුගේ ප්‍රවාහන ව්‍යාපාරය සඳහා මාස කිහිපයක් භාවිතා කරනු ලැබිය. කෙසේවුවද, මෙම ලොරි රථය විශාල ප්‍රමාණයේ අළුත්වැඩියාවක් සඳහා **පීටර්** විසින් **ජේම්ස්**ගේ ගරාජයට භාරදී තිබූ එකක් විය. **ලැරී** විසින් ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් සඳහා මෙම ලොරි රථයෙන් නුවර බලා යමින් සිටින අතරතුරදී **පීටර්** ට මෙම රථය දැකගත හැකි විය. එහිදී **පීටර්** විසින් **ජේම්ස්**ගේ ගරාජයට අළුත්වැඩියාවක් සඳහා භාරදී තිබියදී මීට මාස කිපයකට පෙර අතුරුදහන් වු ලොරි රථය මෙය බවට හඳුනාගන්නා ලද අතර, **පීටර්** විසින් මෙම ලොරි රථය තම භාරයට ගන්නා ලදී. **ජේම්ස්** ට මෙම ලොරි රථය සඳහා කිසිම අයිතියක් නොමැති බවට **ලැරී** විසින් අවබෝධ කරගත් අතර, **ලැරී,** එම ලොරි රථයේ නියම හිමිකරු වන **පීටර්** වෙත බාර දීමට සිදුවිය. **ලැරී** විසින් ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා **ජේම්ස්** ට එරෙහිව නඩු පවරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මේ සම්බන්ධයෙන් **ලැරී** සතු නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව භාණ්ඩ වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

අධ්‍යක්ෂකවරුන් යනු සමාගමක් පාලනය කරන සහ කළමනාකරණය කරනු ලබන ප්‍රධාන පුද්ගලයන් වේ. එබැවින් සමාගමකට අධ්‍යක්ෂකවරුන් තෝරාගැනීම ඉතා වැදගත් වන අතර, ඔවුන්ගේ සුදුසුකම් කෙරෙහි අවධානය යොමු කරමින් සමාගමට ඔවුන්ගෙන් ලැබිය යුතු රාජකාරී නියම කළ යුතුය. 2007 අංක 07 දරණ සමාගම් පනත මගින් ඉහත සඳහන් ක්ෂේත්‍රවලට අදාල විධිවිධාන සපයා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වීමට සපුරාලිය යුතු සුදුසුකම් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) සමාගම් පනත අනුව අධ්‍යක්ෂකවරයෙකුගේ ප්‍රධාන යුතුකම් හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(c) සීමාසහිත පෞද්ගලික සමාගමක අවශ්‍ය කෙරෙන අවම අධ්‍යක්ෂවරුන්ගේ ගණන **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**සුරාජ්** මසකට දළ වශයෙන් රු.100,000/- ක පමණ ආදායමක් උපයනු ලබන රාජ්‍ය සේවකයෙකු වේ. ඔහු, ඔහුගේ මාසික සිල්ලර බඩු අවශ්‍යතාවය සාමාන්‍යයෙන් **විමල් ස්ටෝර්ස්** වෙතින් මිලදී ගනු ලැබේ. **විමල් ස්ටෝර්ස්** සතුව මහා පරිමාණ ගබඩා දෙකක් ඇති අතර, ඒවා ඔවුන්ගේ පරිභෝජන භාණ්ඩ ගබඩාකිරීම සඳහා යොදා ගනී. **සුරාජ්** මැයි මාසයේදී ඔහුගේ සිල්ලර බඩු අවශ්‍යතාවය මිලදී ගැනීම සඳහා වෙළෙඳසැලට ගිය අතර, කිරි පැකට්ටුවක මිල මුලින් සළකුණු කරන ලද මිල මත ඇලවූ ස්ටිකරයක් භාවිතයෙන් **විමල්** විසින් රු.780/- සිට රු.1,020/- දක්වා වැඩිකර ඇති බව අවබෝධ කරගන්නා ලදී. **විමල්** විසින් අධික ලාභයක් ලැබීමේ අරමුණින් ඔහු සතු පැරණි තොගයේ මිල වෙනස්කොට ඇති බව **සුරාජ්** ට වැටහුණි. මිල වෙනස්කිරීම පිළිබඳව **සුරාජ්** විසින් **විමල්ගෙන්** ප්‍රශ්න කිරීමත් සමග කිසිදු සිල්ලර භාණ්ඩයක් **සුරාජ්** ට විකිණීම ප්‍රතික්ෂේප කළ **විමල්** වහාම තම වෙළෙඳසැලෙන් පිටව යන ලෙස **සුරාජ්** ට දැන්විය. පසුව **සුරාජ්** විසින් මේ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පැමිණිලි කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත කරුණු සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඉහත සිද්ධියට අදාලව **විමල්ගේ** වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**ඇන්** විසින් **සිල්වාට**, රු.52,000/- ක චෙක්පතක් *"ගනුදෙනු කළ නොහැක"* යනුවෙන් රේඛණය කර ලබාදෙන ලදී. **සිල්වා** විසින් මෙම චෙක්පත මුදල් කරගැනීම පිණිස බැංකු කවුන්ටරයට ඉදිරිපත් කරන ලදී. මෙහිදී බැංකුවේ මුදල් අයකැමි විසින් මෙම චෙක්පතෙහි *"විසිපන්දහසක් පමණි "* යනුවෙන් අකුරෙන් සටහන් කර ඇති බව හඳුනාගන්නා ලදී. තවද, **ඇන්ගේ** බැංකු ගිණුමේ ශේෂය රු.10,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත කරුණ සම්බන්ධයෙන් බැංකුවේ වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) "සාමාන්‍ය රේඛණය" සහ "විශේෂ රේඛණය" අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**අපේක්ෂා** විසින් **සීමාසහිත ආරක්ෂා රක්ෂණ සමාගමෙන්** ජීවිත රක්ෂණ ඔප්පුවක් අයදුම් කරන ලදී. මෙහිදී රක්ෂණ සමාගම විසින් ඇය පසුගිය වසර 5 තුළදී කිසියම් වෛද්‍යවරයෙකු වෙත යොමුවී තිබේදැයි විමසන ලදුව **අපේක්ෂා** විසින් එසේ වෛද්‍යවරයෙකු වෙත යොමුවී "නොමැති" බව ප්‍රකාශ කරන ලදී. නමුත් ඇය වයිරස් උණ රෝගය (influenza) සඳහා වෛද්‍ය උපදෙස් මත කිසියම් වූ ඖෂධයක් ලබාගෙන තිබූ නමුත් මෙම රෝගී තත්ත්වය ඇයට රැකියාවට යාමට බාධාවක් නොවීය. කෙසේනමුත්, ජීවිත රක්ෂණාවරණය ලබාගැනීමෙන් අනතුරුව ඇයට දරුණු සනයේ වයිරස් උණ රෝගයක් වැළඳුනු අතර, **අපේක්ෂා** ඇඩිලෙස රෝගාතුර විය. පසුව මෙම රෝගය හේතුකොටගෙන ඇයගේ පෙනහළුවලට සිදුවූ දැඩි හානිය හේතුවෙන් ඇය මරණයට පත්විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **අපේක්ෂාගේ** යැපෙන්නන් හට **සීමාසහිත ආරක්ෂා රක්ෂණ සමාගමෙන්** ලබාගත් ජීවිත රක්ෂණ ආවරණය යටතේ වන්දි ඉල්ලා සිටිය හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 07)

(b) රක්ෂණ ගිවිසුමක ප්‍රධාන මූලිකාංග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

(A) **රාණි** විසින් **සීමාසහිත ABC සමාගමේ** සහායක ගණකාධිකාරි තනතුර සඳහා අයදුම්කොට සම්මුඛ පරීක්ෂණය සඳහා ද සහභාගී විය. සමාගමේ කළමණාකාරිත්වය ඇයව මෙම තනතුර සඳහා බඳවා ගැනීමට තීරණය කළද, ඇයට මේ බව දැනුම් දී නොතිබුණි. මේ අතර, සමාගම විසින් ඇයව එම තනතුර සඳහා බඳවා ගැනීමට කැමැත්තෙන් සිටින බව **සීමාසහිත ABC සමාගමේ** අධ්‍යක්ෂකවරයෙකු විසින් ඇයට නිල නොවන ලෙස දන්වා තිබුණි. එම තොරතුර මත පදනම්ව ඇය දැනට සිටින රැකියාවෙන් ඉවත් වූ නමුත් **සීමාසහිත ABC සමාගම** විසින් එම තනතුර සඳහා වෙනත් අයෙකු පත්කිරීමට තීරණය කරන ලදී.

**රාණිගේ** සැමියා වන **රාජා** විසින් ඔවුන්ගේ නිවස රු. මිලියන 15 කට විකිණීමට **අමල්** වෙත අර්පණය කරන ලදී. මීට ප්‍රතිචාර ලෙස **අමල්** විසින් මෙම නිවස රු. මිලියන 14 කට මිලට ගැනීමට කැමැත්ත පලකරන ලද අතර, **රාජා** විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. පසුව, **අමල්** විසින් එම නිවස රු. මිලියන 15 කට මිලට ගැනීමට කැමැත්ත පලකරන ලදී. පසුව, **රාජා** විසින් එම නිවස රු. මිලියන 15 කට විකිණීමේ අදහස අත්හැර තිබූ බැවින් එය ප්‍රතික්ෂේප කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අර්පණය අවසන් වියහැකි ක්‍රම දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **සීමාසහිත ABC සමාගමට** එරෙහිව, **රාණිගේ** නෛතික අයිතිවාසිකම් (legal rights) **විමසන්න.** (ලකුණු 06)

(c) **රාජා** සහ **අමල්** අතර වලංගු ගිවිසුමක් පවතිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(B) **වීණා, කැතීගේ ව්‍යාපාරයේ** කළමනාකරුවෙකු ලෙස සේවය කරනු ලබන අතර, ඇය ව්‍යාපාරයේ සියලුම නිල වාර්තා වෙත ප්‍රවේශ වී තිබුණි. එමෙන්ම **වීණා** ව්‍යාපාරයේ බොහෝ ප්‍රධාන ගනුදෙනුකරුවන්ගේ ගිණුම් හැසිරවීමේ යෙදී සිටින ලදී. මේ අතරතුර, **වීණා** විසින් **කැතීගේ** ව්‍යාපාරයට තරඟකාරී ව්‍යාපාරයක් ආරම්භකොට ඇති බව **කැතී** ට දැනගැනීමට ලැබුණි. **වීණා** විසින් **කැතීගේ ව්‍යාපාරයේ** සේවයේ නියුතුව සිටියදී ලබාගත් තොරතුරු යොදාගෙන රහස් ලාභ උපයාගෙන තිබුණි.

මේ අතරවාරයේදී, **කැතීගේ** මිතුරෙකු වන **ටෝනි** මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමට ඇයට උදව් කළ අතර, ඇය සතු ගාල්ලේ පිහිටි දේපළක් විකිණීමට සුදුසු ගැනුම්කරුවෙකු පිළිබඳ සොයාබලන ලෙස **කැතී, ටෝනි** ට දැනුම්දෙන ලදී. **ටෝනි** විසින් දේපළ විකිණීම සඳහා ගැනුම්කරුවෙකු සොයාගන්නා ලදුව ඒ බව **කැතී** ට දැනුම්දෙන ලදී. සතියක කාලයකට පසුව **ටෝනි** විසින් එම දේපළ මුල් ගැනුම්කරුගේ මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීමට කැමති ගැනුම්කරුවෙකු සොයාගන්නා ලදී. නමුත් **ටෝනි** විසින් මේ පිළිබඳව **කැතී** ව දැනුවත් කර නොතිබුණි. **කැතී** විසින් **ටෝනි** ට විශේෂයෙන් උපදෙස් ලබා දී තිබුණේ අදාල දේපළ මිලට ගැනීමට කැමති ඕනෑම ගැනුම්කරුවෙකු පිළිබඳව තමාව දැනුවත් කරන ලෙසයි. **කැතී** විසින් අදාල දේපළ මුල් ගැනුම්කරුට විකුණනු ලැබූ අතර, ඇයට රු. මිලියන 5 ක අලාභයක් **ටෝනිගේ** නොසැලකිලිමත්භාවය නිසා සිදුවූ බව පසුව දැනගන්නට ලැබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නියෝජ්‍යත්ව නීතිය යටතේ **කැතී** සම්බන්ධයෙන් **වීණාගේ** යුතුකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) නියෝජ්‍යත්ව නීතිය යටතේ **කැතී** සහ **ටෝනි** අතර පවතින අයිතිවාසිකම් සහ යුතුකම් **විමසන්න.**(ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |